**PDMO**

Public Debt Management Office|Sri Lanka

# මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030

## සහ

# වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2026


රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය



© 2026 රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය



ලේකම් කාර්යාලය (3 වන මහල)

කොළඹ 00100

ශ්‍රී ලංකාව

info@pdmo.gov.lk

PDMO

Public Debt Management Office|Sri Lanka

# මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය

## උපායමාර්ගික සහ විචක්ෂණශීලී ණය කළමනාකරණය සඳහා මාර්ගෝපදේශය

# 2026-2030

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

© 2026 රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
ලේකම් කාර්යාලය (3 වන මහල)
කොළඹ 00100
ශ්‍රී ලංකාව
info@pdmo.gov.lk

# පටුන

1. විධායක සාරාංශය 3

2. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ සමාලෝචනය 4

2.1 නීතිමය රාමුව 4

2.2 ආයතනික රාමුව 4

2.3 ණය කළමනාකරණ අරමුණු 4

3. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 5

3.1 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ ආවරණය 5

3.2 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029 5

4. ආණ්ඩුවේ ණය කළඹෙහි වර්තමාන ව්‍යුහය 6

4.1 ආණ්ඩුවේ ණය සංයුතිය 6

4.2 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ ණය 7

4.3 දැනට පවතින ආණ්ඩුවේ ණය පියවීමේ පැතිකඩ 8

4.4 වත්මන් ආණ්ඩුවේ ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම 9

4.4.1. ආණ්ඩුවේ ණය කළඹේ පොලී පිරිවැය 10

4.4.2. ප්‍රතිමූල්‍යකරණ අවදානම 11

4.4.3. පොලී අනුපාත අවදානම 11

4.4.4. විදේශ විනිමය අවදානම 12

5. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සහ රජයේ ණය තිරසරභාවය කෙරෙහි එහි බලපෑම 13

5.1 ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ජයග්‍රහණ 13

6. මූලික සාර්ව ආර්ථික උපකල්පන 16

7. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 17

7.1 2030 වසර අවසානයේ ණය කළමනාකරණ ඉලක්ක 17

7.2 2026 – 2030 සඳහා මූල්‍යකරණ උපායමාර්ගය 18

7.4. සීමාවන් සහ අභියෝග 20

8. නිගමනය 22

# 1. විධායක සාරාංශය

සිය ණය කළමනාකරණ පිළිවෙත්, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස සැකසීමට ශ්‍රී ලංකාව කැපී පෙනෙන පරිවර්තනීය වෙනසක් සිදුකර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත (PDMA) බලාත්මක කිරීමත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) පිහිටුවීමත් ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා සිදුකරන ලද මූලික අඩිතාලම් වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සිය ණය තිරසාරභාවය පිළිබඳ විශ්ලේෂණය යටතේ සඳහන් කර ඇති ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක ළඟා කර ගැනීමට, මෙම ශක්තිමත් නීතිමය පසුබිම මෙන්ම මධ්‍යගත ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම ද අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිසංස්කරණ මගින් ජාත්‍යන්තරව පිළිගත් හොඳම පරිචයන් හඳුන්වා දීමෙන් රාජ්‍ය ණය කළමනාකරණයෙහි විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ උපායමාර්ගික සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමත් කරනු ලබයි.

රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ, චක්‍රීය වසර පහක කාලයක් සඳහා වන මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක් (MTDS) පිළියෙළ කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට විධිවිධාන නියම කර ඇති අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු වේ. මෙම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින්, තිරසර රාජ්‍ය ණය කළමනාකරණයත්, පිරිවැය සහ අවදානම තුලනය කර ගනිමින් රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීමත් මෙන්ම රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයට සහාය වීමත්, සඳහා වන ව්‍යුහාත්මක මග පෙන්වීමක් ලබා දීම ද සිදු කරයි.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026–2030 ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත. ණය තිරසරභාවය ශක්තිමත් කිරීමත්, පොලී අනුපාත අවදානම සහ ප්‍රතිමූල්‍යයන අවදානම වැනි අවදානම් තත්ත්වයන් අවම කිරීමත් කෙරෙහි අවධානය යොමු කරයි. වත්මන් ණය කළඹ විශ්ලේෂණය කිරීමේදී, කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ඉහළ ප්‍රමාණයක පැවතීමෙන් පැන නැගී ඇති ප්‍රති-මූල්‍යයන අවදානම මෙන්ම පහල අගයක පවතින පොලී අනුපාත නැවත සකස් කිරීම සඳහා වන සාමාන්‍ය කාලය (ATR) හේතුවෙන් ඇති කරනු ලබන පොලී අනුපාත අවදානම (Interest Rate Risk) ප්‍රධාන අභියෝගයන් ලෙස හඳුනාගෙන ඇත. එසේම රජයේ ආදායමෙන් පොලිය ගෙවීම සඳහා වෙන් කරනු ලබන කොටස ද තීරණාත්මක පිරිවැය දර්ශකයක් ලෙස හඳුනාගෙන තිබේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 තුලින් ආණ්ඩුවේ ණය කළඹෙහි පිරිවැය සහ අවදානම යන කරුණු දෙකම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කර ගනිමින් මූලික වශයෙන් සකස් කර ඇත. ඒ අනුව, 2026 වසරේ දළ ණය ගැනීමේ අවශ්‍යතාවයෙන් සියයට 90 ක් දේශීයව සපුරා ගැනීමටත්, ඉතිරි සියයට 10, 2026 වසරේ විදේශීය ණය ගැනීම් මගින් සපුරා ගැනීමටත් අපේක්ෂා කරනු ලැබේ. විදේශ මූල්‍යයනයන් විචක්ෂණශීලී ව සමතුලිත කිරීම සඳහා 2027-2030 කාල පරිච්ඡේදය තුළදී දේශීය ණය ගැනීම සියයට 85 ක මට්ටමකට අඩුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම උපායමාර්ගය මඟින් කෙටිකාලීන ණය මත යැපීම අඩු කිරීම ඉලක්ක කර ඇත. එමගින්, මුළු ණය ප්‍රමාණයෙන් භාණ්ඩාගාර බිල්පත්වල කොටස 2025 වසර අවසාන වන විට සියයට 10.7 සිට 2030 වසර වන විට සියයට 5 දක්වා අඩු කිරීමටත්; සාමාන්‍ය ණය කල්පිරීමේ කාලය (average debt maturity) වසර 6.8 සිට 2030 වසර වන විට වසර 8 දක්වා දීර්ඝ කිරීමටත්; උපායමාර්ගික කාලය තුළ ආදායමට සාපේක්ෂව පොලී ගෙවීමේ අනුපාතය සියයට 52.2 සිට සියයට 35 දක්වා අඩු කිරීමටත් ඉලක්ක ගත කර ඇත.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026–2030 තුළින් ශ්‍රී ලංකාවේ ඉදිරි වසර 05 තුළදී රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වන පැහැදිලි රාමුවක් සකසා ඇත. දේශීය හා විදේශීය මූල්‍යකරණය විචක්ෂණශීලී ව සංකලනය කිරීම, ණය කල් පිරීමේ කාලය දීර්ඝ කිරීම, සහ ප්‍රතිමූල්‍යකරණය හා පොලී අනුපාත අවදානම් අවම කිරීමත් තුළින් ණය තිරසරභාවය ශක්තිමත් කිරීමත් ණය ගැනීමේ පිරිවැය අඩු කිරීමත් නියමිත දිනට ණය ආපසු ගෙවීම තහවුරු කිරීමත් උපායමාර්ගය තුළින් අපේක්ෂා කරයි. ආදායම පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය, දේශීය ණය වෙළඳපොළ සංවර්ධනය, වගකීම් කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ ආයෝජක විශ්වාසය වැඩි කිරීම සඳහා රජයේ කැපවීම, ශ්‍රී ලංකාවේ දිගුකාලීන ණය තිරසරභාවය සුරක්ෂිත කිරීම සඳහා ඒකාබද්ධව දායක වනු ඇත.

# 2. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ සමාලෝචනය

## 2.1 නීතිමය රාමුව

2024 වසරේ ජූනි මස 18 වන දින බලාත්මක කරන ලද 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ජාත්‍යන්තර පිළිගත් පරිචයන්ට අනුකූලව සකස් කරන ලද ඒකාබද්ධ ව්‍යවස්ථාවකි. මීට ප්‍රථම විවිධ ව්‍යවස්ථා තුළ විසිරී තිබූ නෛතික විධිවිධාන එක් ව්‍යවස්ථාවකට ගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වඩාත් විධිමත්, ඵලදායී සහ ඉදිරි දැක්මක් සහිත නෛතික රාමුවක් මෙම පනත මගින් සපයන අතර, රාජ්‍ය ණය කළමනාකරණය සඳහා නවීන ක්‍රමවේදයන් ද හඳුන්වා දෙනු ලබයි.

## 2.2 ආයතනික රාමුව

2024 වසරේ දෙසැම්බර් මස 02 වන දින රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) පිහිටුවීම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ ප්‍රමුඛ සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. එය පිහිට වූ දා සිට, ආයතනික හැකියාවන් ගොඩනැගීම, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වූ නියාමන පදනම් ස්ථාපිත කිරීම සහ නවීන ණය කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය කිරීමෙහි ලා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සුවිශේෂී ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. මීට ප්‍රථම ආයතන කිහිපයක් අතර විසිරී තිබූ රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ සියලුම මෙහෙයුම් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යටතට ගෙන එන ලදී.

## 2.3 ණය කළමනාකරණ අරමුණු

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 3 වන වගන්තිය යටතේ රාජ්‍ය ණය කළමනාකරණ අරමුණු පැහැදිලිව සඳහන් කර ඇත:

අ. රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ ණය ගෙවීමේ වගකීම් කාලානුරූපීව පියවීම;

ආ. මධ්‍යකාලීන සහ දිගුකාලීන දක්වා කාලය තුළ විචක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුකූලව, හැකිතාක් අවම පිරිවැයකින් ණය ගැනීම, සහ

ඉ. දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

# 3. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය

රාජ්‍ය ණය කළමනාකරණ පනතෙහි 11 වන වගන්තියට අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කළ යුතු අතර, එය පස් අවුරුදු කාලසීමාවක් මත පදනම්ව සකස් කර වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුවේ. මෙම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය රජයේ මධ්‍යකාලීන මූල්‍ය රාමුවට අනුකූල විය යුතු අතර, එය සැකසීමේදී සාර්ව ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන්, දැනට පවතින රාජ්‍ය ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම්, විවිධ ණය හිමියන්ගේ අරමුදල් තත්ත්වය සහ අනාගත ණය අවශ්‍යතා හා ණය සේවා පිරිවැයට බලපෑම් කළ හැකි අවදානම් තත්ත්වයන් ද සැලකිල්ලට ගත යුතුය.

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු, උපායමාර්ගය සකස් කරන ලද වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතෙහි දෙවන වර කියවීමට පසුව නොවන පරිදි මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මඟින් රජයේ අරමුදල් අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශයක් සපයනු ලබන අතර, ණය ගැනීම වඩාත් පිරිවැය ප්‍රතිලාභීව සිදු කරනු ලබන බව අවධාරණය කරන අතරම ණය මට්ටම් ස්ථාවරවත්වය හා තිරසාරබව ද සහතික කරයි.

## 3.1 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ ආවරණය

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මඟින් ආණ්ඩුවේ ඍජු පාලනය යටතේ පවතින දේශීය සහ විදේශීය ණය පමණක් ආවරණය කරනු ලබයි. මෙම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය තුළට රාජ්‍ය ව්‍යවසායයන්ට සහ උප-ජාතික මට්ටමට අයත් ආයතනවලට රජය විසින් ලබා දී ඇති ඇපකර සහිත ණය හෝ ඇපකර රහිත ණය ඇතුළත් නොවේ.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කිරීමේදී විදේශීය ණය ලෙස ශ්‍රී ලංකාවෙන් පිටත පාර්ශවයන් සමග ගිවිසගත් ණය මෙන්ම, දේශීයව ලබා ගත් නමුත් විදේශ මුදල්වලින් නම් කරන ලද ණය ද වේ. දේශීය ණය යනු ශ්‍රී ලංකාව තුළදී ගන්නා ලද දේශීය මුදලින් නම් කරන ලද ණය වේ.

## 3.2 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2024-2030

නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමගම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029 සකස් කරන ලදී. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029 යටතේ උපායමාර්ග හතරක් ඇගයීමට ලක් කර, ඉන් භාණ්ඩාගාර බිල්පත් ක්‍රමයෙන් අඩු කිරීම සහ දේශීය ණය කළඹේ කල්පිරීමේ කාලය වැඩි කිරීමේ ඉලක්කය ලගා කිරීම අරමුණු කර ගනිමින් දේශීය වෙළඳපොළෙන් ණය ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන උපායමාර්ගය තෝරා ගන්නා ලදී. එමෙන්ම, පොලී අනුපාතික අවදානම අවම කිරීම සඳහා ස්ථාවර පොලී අනුපාතික සහිත ණය ප්‍රමාණය ඉහළ නැංවීමට ද අවධානය යොමු කරන ලදී. ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීම පිණිස, වසරක් ඇතුළත පොලී අනුපාතිකය නැවත සකස් කිරීමට ඇති ණය ප්‍රමාණය අඩු කිරීම ද ඉලක්ක කරන ලදී.

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029 සඳහා භාවිතා කරන ලද ණය පිළිබඳ දත්ත අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වෙතින් සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබා ගන්නා ලදී. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කරන අවස්ථාවේදී පැවති දත්ත සමපාත කිරීමේ ක්‍රියාවලිය සලකා බලා, විදේශීය හා දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් උපකල්පන කිහිපයක් භාවිත කරන ලදී. 2025 අවසානය වන විට පුරෝකථනය කර ඇති පරිදි, අපේක්ෂිත ඉලක්කයට අනුකූලව භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය 2024 වසර අවසානයේ පැවති මුළු ණය කළඹෙන් සියයට 13.9 සිට සියයට 10.7 දක්වා සාර්ථකව අඩු වී ඇති බව නිරීක්ෂණය වේ. තවද, මුළු ණයවල ප්‍රතිශතයක් ලෙස වසරක් ඇතුළත කල් පිරෙන ණය ප්‍රමාණය 2024 වසර අවසානයේ සියයට 19.1 සිට 2025 වසරේදී සියයට 2.9 කින් අඩු වී ඇත. මුළු ණය කළඹේ සාමාන්‍ය කල්පිරීමේ කාලය ද ධනාත්මක දිශාවක් පෙන්නුම් කර ඇත.

# 4. ආණ්ඩුවේ ණය කළමණාකරණ වර්තමාන ව්‍යුහය

## 4.1 ආණ්ඩුවේ ණය සංයුතිය

2025 වසරේ ජූනි මස අවසානය වන විට, ශ්‍රී ලංකාවේ සමස්ත ආණ්ඩුවේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 30,795 ක් ලෙස වාර්තා වන අතර, මෙම මුදල දේශීය සහ විදේශීය ණය බැඳීම් යන දෙකින්ම සමන්විත වේ. මෙම සමස්ත ණය කළඹ විශ්ලේෂණය කිරීමේ දී, එහි බහුතරය  දේශීය ණය වලින් සමන්විත වන බව පෙනී යයි. එනම්, සමස්ත ණයවලින් දළ වශයෙන් සියයට  64 ක් දේශීය ණය වන අතර, ඉතිරි සියයට 36 ක  ප්‍රමාණය විදේශීය ණය මගින් නියෝජනය වේ.

**වගුව 01 : 2025 වසරේ ජූනි මස අවසානය වන විට  ආණ්ඩුවේ ණය තොගයේ සංයුතිය**

| | *ශ්‍රී ලංකා රුපියල් බිලියන* |
|---|---|
| **දේශීය ණය** | **19,655** |
| භාණ්ඩාගාර බිල්පත් | 3,921 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 15,039 |
| වෙනත් | 695 |
| **විදේශීය ණය** | **11,140** |
| බහු පාර්ශවික | 4,035 |
| ද්වි පාර්ශවික | 3,300 |
| වෙළඳපොළ ණය ගැනීම් | 3,805 |
| එකතුව | **30,795** |

**ආණ්ඩුවේ ණය තොගය ණය උපකරණ අනුව රූප සටහන් 01 මගින් දක්වා ඇත.**

රූප සටහන  01- 2025.06.30 දිනට පියවීමට ඇති ආණ්ඩුවේ ණය තොගය - ණය උපකරණ අනුව



### 4.2 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ ණය

රූප සටහන 02: ආණ්ඩුවේ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස




මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය   ඇ - ඇස්තමේන්තු

පසුගිය දශක හතක පමණ කාලය පුරා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සමස්ත ණය ප්‍රමාණය විශාල ලෙස ඉහළ ගොස් ඇති අතර, එය 1950 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 17 ක සිට 2022 වසරේදී සියයට 114.2 දක්වා වැඩි වී ඇත.

1977 වසරේදී ආර්ථිකය ලිබරල්කරණීය වීමෙන් පසුව, රජය විදේශ ණය ගැනීම් මත යැපීම සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර, 1950-1976 කාලය හා සැසඳීමේදී සියයට 10 ක සාමාන්‍ය අගය පැවති විදේශ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතය සියයට 30 ඉක්මවා ගොස් ඇත. 1990 දශකය වන විට, මෙම විදේශ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දළ වශයෙන් සියයට 50 දක්වා වර්ධනය වී තිබුණි.

2000 වසරේ මුල් භාගයේ සිට සමස්ත ණය ප්‍රමාණයෙන් දේශීය ණය ක්‍රමයෙන් වැඩි වී ඇත. 2010 සහ 2018 අතර කාලය තුළ මුළු ණය තොගය සැලකිය යුතු ලෙස අඛණ්ඩව වැඩි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසර වන විට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ණය, දළ දේශීය නිෂ්පාදිතයට දක්වන අනුපාතය ඉතිහාසයේ ඉහළම මට්ටමට ළඟා විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සහාය දක්වන ලද විස්තීර්ණ අරමුදල් පහසුකම් (EFF) වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවයේ (revenue based fiscal consolidation) ඒකාබද්ධ ප්‍රතිඵල පිළිබිඹු කරමින්, ණය-දළ දේශීය නිෂ්පාදිත අනුපාතය 2022 වසරේදී සියයට 99.1 (දළ පදනමින්) දක්වා අඩු වූ අතර, 2025 වසරේදී තවදුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 4.3 දැනට පවතින ආණ්ඩුවේ ණය පියවීමේ පැතිකඩ

ණය පියවීමේ පැතිකඩ මගින් ආණ්ඩුවේ දැනට පවතින ණයවල කල්පිරීමේ ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් පෙන්නුම් කරන අතර එමගින් කාලපරිච්ඡේදයක් පුරාවට ආණ්ඩුවේ ණය ගෙවිය යුත්තේ කවදාද, කොපමණ ද යන්න සාමාන්‍යයෙන් දැක්වේ.

2025 වසර අවසානයේදී, රුපියල් බිලියන 3,600 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති නොපියවූ භාණ්ඩාගාර බිල්පත්, 2026 වසරේදී ආපසු ගෙවීමට නියමිත අතර, එමගින් රූප සටහන 03 හි දැක්වෙන පරිදි කෙටිකාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානමක් පෙන්නුම් කල ද එම අවදානම ඵලදායී ආදායම් සහ මුදල් ප්‍රවාහය කළමනාකරණය තුළින් අවම කර ගත හැක. 2024 සහ 2025 ආරම්භයේදී භාණ්ඩාගාර බිල්පත් තොගය පිළිවෙලින් රුපියල් බිලියන 4,092 ක් සහ රුපියල් බිලියන 4,070 ක් වූ අතර රජය එම ප්‍රමාණය ද ප්‍රතිමූල්‍යකරණය කර ඇත.

රූප සටහන 03- 2025 වසර අවසානය දක්වා ඇස්තමේන්තු කර ඇති පරිදි දැනට පවතින ආණ්ඩුවේ ණය පියවීමේ පැතිකඩ රුපියල් බිලියන වලින්




**මූලාශ්‍රය:** රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
විදේශීය ණයවලට ශ්‍රී ලංකාව තුළදී විදේශ විනිමය (FX) වලින් ගිවිසුම්ගත කර ඇති ණය ඇතුළත් වේ.
දේශීය ණය නියෝජනය කරන්නේ දේශීය මුදලින් (LKR) ගිවිසුම්ගත කර ඇති ණයයි
ඇ - ඇස්තමේන්තු

ඊට අමතරව, දේශීය ණය පියවීමේ පැතිකඩ ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර (T-bonds) වලින් සමන්විත වන අතර, 2028 වසරේ දී කල්පිරීම්වල සාමාන්‍ය වර්ධනයක් අපේක්ෂා කරන අතර එය රුපියල් බිලියන 2,155 කි. 2022 වසරේ ආර්ථික අර්බුදය හේතුවෙන්, බැඳුම්කර නිකුත් කිරීම් ඵලදා වක්‍රයේ කෙටිකාලීන හා මධ්‍යකාලීන කණ්ඩ කෙරෙහි සංකේන්ද්‍රණය වීම නිසා, 2027-2033 කාලය තුළ බැඳුම්කර පියවීම්වල ඉහළ යොමුවීමක් ඇති වී තිබේ. කෙසේ වෙතත්, මෑත කාලීනව මූල්‍ය කාර්ය සාධනයේ, වෙළඳපොළ ස්ථාවරත්වයේ සහ සාර්ව ආර්ථික දර්ශකවල දියුණුවත් සමඟ, ආයෝජක උනන්දුව ක්‍රමයෙන් මධ්‍යකාලීන හා දිගුකාලීන කල්පිරීම් වෙත යොමුවෙමින් පවතී.

විදේශීය අංශය දෙස බලන විට, නිල ණයහිමි කමිටුව (OCC) සමඟ සිදු කරන ලද විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් අනාගත ණය ආපසු ගෙවීම් සමාන ලෙස ව්‍යාප්ත වී ඇති අතර, එමඟින් විදේශීය ණය පියවීම් කෙටිකාලීනව ඒකරාශීවීම අඩු වී ඇත. බැඳුම්කර හුවමාරුව යටතේ නිකුත් කරන ලද නව ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර විවිධ කොන්දේසි සහ කූපන් අනුපාත සහිත පියවීමේ ව්‍යුහයක් අනුගමනය කරන අතර, එය විවිධාංගීකරණය වූ ණය කළඹක් ඇති කිරීමට ද දායක වී ඇත. රූප සටහන් 03 හි පෙන්වා ඇති පරිදි, විදේශ විනිමය (FX) ණය වාරික ගෙවීම්, ප්‍රතිව්‍යුහගත කරන ලද විදේශීය ණයවල වාරික ආපසු ගෙවීම හේතුවෙන් 2028 වසරේ සිට ක්‍රමයෙන් ඉහළයාමක් සහ, 2038 වසරේ දී උපරිමයකට ලඟාවීමක් අපේක්ෂා කරන අතර එය 2045 දක්වා ක්‍රමයෙන් අඩුවීමක් අපේක්ෂා කෙරේ.

## 4.4 වත්මන් ආණ්ඩුවේ ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම

ආණ්ඩුවේ වත්මන් ණය කළඹෙහි බැදී පවතින පිරිවැය හා අවදානම ප්‍රධාන අවදානම් සහ පිරිවැය දර්ශක මගින් තක්සේරු කළ හැකිය.

වගුව 02: වත්මන් ආණ්ඩුවේ ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම- 2025 වසර අවසානය වනවිට පුරෝකථනය කළ පරිදි

| අවදානම් දර්ශක | | විදේශ ණය [1] | දේශීය ණය[2] | සමස්ථ ණය ප්‍රමාණය |
|---|---|---|---|---|
| ණය ප්‍රමාණය (රුපියල් බිලියන වලින්) | | 11,801 | 19,238 | 31,039 |
| ණය ප්‍රමාණය (ඇමරිකානු ඩොලර් මිලියන වලින්) | | 38.1 | 62.1 | 100.1 |
| නාමික ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | | 36.9 | 60.1 | 97.0 |
| ණය තොගයේ වර්තමාන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස[3] | | 34.2 | 60.1 | 94.4 |
| ණය පිරිවැය[2] | දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම[4] | 1.3 | 6.9 | 8.2 |
| | ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම | 11.8 | 44.4 | 52.2 |
| | බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතිකය ( ප්‍රතිශතය) | 3.4 | 11.5 | 8.5 |
| ප්‍රතිමූල්‍ය කරණ අවදානම[2] | කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර) | 9.7 | 4.6 | 6.8 |
| | වසර ක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස) | 2.9 | 26.1 | 16.2 |
| | වසරක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස) | 1.3 | 15.7 | 17.0 |
| පොලී අනුපාත අවදානම[2] | ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATR) (වසර) | 7.9 | 4.4 | 5.9 |
| | වසරක් තුළ දී ප්‍රතිස්ථාවර වන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස) | 23.1 | 29.6 | 26.8 |
| | භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව ස්ථාවර පොලී අනුපාත සහිත ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස) | 78.7 | 96.1 | 88.7 |
| | භාණ්ඩාගාර බිල්පත් (මුළු ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස) | 0.0 | 18.7 | 10.7 |
| විදේශ විනිමය අවදානම | විදේශ විනිමය ණය (මුළු ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස) | | | 37.8 |
| | කෙටි කාලීන විදේශ විනිමය ණය (සංචිතවල ප්‍රතිශතයක් ලෙස) | | | 0.0192 |

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

[1] විදේශීය ණය වලට දේශීය වශයෙන් (ශ්‍රී ලංකාව තුළදී) විදේශ විනිමය (FX) වලින් ගිවිසුම්ගත කර ඇති ණය ද ඇතුළත් වේ.
[2] දේශීය ණය වලට දේශීය වශයෙන් (ශ්‍රී ලංකාව තුළදී) දේශීය මුදලින් (LKR) ගිවිසුම් ගත කර ඇති ණය ඇතුළත් වේ.
[3] දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පුරෝකථනය කර ලද ණය සේවාකරන ගෙවීම් පදනම් කර ගෙන ඇති අතර සහනදායී හෝ අර්ධ සහනදායී කොන්දේසි මත එම ණය උපකරණ සඳහා 5% ක වට්ටම් අනුපාතික යොදා ගන්නා ලදී.
[4]බර තබන ලද සාමාන්‍ය පොලී අනුපාතිකය, ප්‍රතිමූල්‍යකරණ සහ පොලී අනුපාතික අවදානම් වැනි පුරෝකතනය කරන ලද මුදල් ප්‍රවාහයන් භාවිතා කරනු ලබන පිරිවැය අවදානම් දර්ශක භාවිතා කිරීමේදී පුරෝකතනය කරන ලද විනිමය අනුපාතික උපකල්පන භාවිතා කරනු ඇත.

ණය කළඹෙහි පිරිවැය ගණනය කරනු ලබන්නේ, පොලී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සහ ආදායමේ ප්‍රතිශතයක් ලෙස ය. එසේම, ණය කළඹෙහි අවදානම, ප්‍රති මූල්‍යකරණ අවදානම, පොලී අනුපාත අවදානම සහ විදේශ විනිමය අවදානම මගින් අගයනු ලබයි.

### 4.4.1. ආණ්ඩුවේ ණය කළඹේ පොලී පිරිවැය

වෙළඳපොළ අනුපාත යටතේ ණයගැනීම් ඇතුලුව සිදුකරන ලද අධික ණයගැනීම් හේතුවෙන් නාමික පොලී ගෙවීම් 2020 වසරේ දී දළ වශයෙන් රුපියල් බිලියන 980 ක් වූ අගයක සිට 2025 වසර වන විට රුපියල් බිලියන 2,650 ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම තත්ත්වය වර්ධනය වන ණය සේවාකරණ පිරිවැය පිළිබිඹු කරයි. 2025 වසර සඳහා විදේශ ණය පොලී ගෙවීම් ඇ.ඩො.මිලියන 1,032 ( ආසන්න වශයෙන් රුපියල් බිලියන 312) ඉන් ඇ.ඩො.මිලියන 794 ක් (ආසන්න වශයෙන් රු.බිලියන 240 ) 30.09.2025 වන විට ගෙවා ඇත.

රූප සටහන 4: ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම්




මූලාශ්‍රය - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පොලී ගෙවීම්-ආදායම් අනුපාතය 2020 සහ 2023 අතර කාලය තුළ සියයට 70–81 ක් පමණ පවතින අතර, රජයේ ආදායමෙන් සැලකිය යුතු විශාල කොටසක් පොලී ගෙවීම් සඳහා යොදාගෙන ඇති බව ඉන් පෙන්නුම් කරයි. 2023 වසරෙන් පසු, මෙම අනුපාතය පහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. 2025 වසර වන විට එය සියයට 52.2 ක් (පුරෝකතනය කරන ලද) පමණ දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ශක්තිමත් ආදායම් වර්ධනයක් හරහා වූ රාජ්‍ය මූල්‍ය වර්ධනය මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ කාලසීමාව තුළදී ණය පොලී ගෙවීමේ අඩුවීමද පෙන්නුම් කරයි. එසේ වුවද, එය තවමත් රජයේ ආදායමෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනු ලැබේ. මෙම තත්ත්වය, අර්බුදයට පෙර සහ අර්බුදයෙන් පසු ආසන්නතම කාලය යන කාල පරිච්ඡේද දෙකෙහිම අත්විඳින ලද සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය බාධක පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවල ධනාත්මක බලපෑම් හේතුවෙන්, මෙම බර ක්‍රමයෙන් ලිහිල් වෙමින් පවතින අතර, පොලී ගෙවීම්- ආදායම් අනුපාතය වැඩිදියුණු වීමේ ලක්ෂණ පෙන්නුම් කරයි.

### 4.4.2. ප්‍රතිමූල්‍යකරණ අවදානම

2025 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට, ප්‍රතිමූල්‍යකරණ අවදානම සමස්ත ණය කළඹෙන් සියයට 12 ක භාණ්ඩාගාර බිල්පත් සහ සියයට 48 ක භාණ්ඩාගාර බැඳුම්කර වලින් සමන්විත වන දේශීය ණය කළඹ තුළ වඩාත්ම සංකේන්ද්‍රණය වී ඇත. ණය කල්පිරීමේ සාමාන්‍ය කාලය කෙටිවීමෙන් සහ වසරක් ඇතුළත කල් පිරෙන දේශීය ණයවල අනුපාතය ඉහළ අගයක් වීමෙන් පැහැදිලි ද්‍රවශීලතා සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම් පෙන්නුම් කරයි. අර්බුදයෙන් පසු කාල පරිච්ඡේදය තුළ, දේශීය ණයවල කල්පිරීමේ පැතිකඩ දීර්ඝ කිරීමට උත්සහයන් ගෙන ඇත. විශේෂයෙන්ම, 2025 වසරේ දෙවන භාගයේදී, වෙළඳපොළ විශ්වාසය වැඩිදියුණු වීම පිළිබිඹු කරමින්, මධ්‍යකාලීන සිට දිගුකාලීන රජයේ සුරැකුම්පත් කෙරෙහි වෙළඳපොළ ඉල්ලුම වෙනස් වී ඇති බව පෙනී යයි.

ඊට වෙනස් ලෙස, විදේශ ණය කළඹ දිගු කල්පිරීමේ කාලයන් සහ කෙටි කාලීන බැඳීම් අඩු වීම හේතුවෙන් විචක්ෂණශීලීව කළමනාකරණය කර ඇති බව පෙනේ. මෙය බොහෝ දුරට සිදුවී ඇත්තේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හරහා ණය කල්පිරීමේ කාලය දිගු කිරීම් ලබා ගැනීමෙනි. නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන එක්සිම් බැංකුව ඇතුළු නිල ණය හිමියන් සමඟ සිදු කළ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වන තෙක් ගෙවීම් කල් දැමීම මගින් කෙටි කාලීන ණය බර ලිහිල් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් (IMF) වැඩසටහන් කාලය තුළදී ගෙවීමට නියමිත ණය සේවාකරණයන් සඳහා ශ්‍රී ලංකාවට සැලකිය යුතු ණය සහනයක් ලැබී ඇත. ශ්‍රී ලංකාවට 2028 වසර දක්වා මූලික ණය මුදල් ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම, පොලී අනුපාත අඩු කිරීම, සහ 2043 වසරේ දී අවසන් ගෙවීම් සහිත සහනශීලි වාරික ගෙවීමේ සැලැස්මක් ලැබී ඇත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමෙන්, ශ්‍රී ලංකාව සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර 6 කින් පමණ දීර්ඝ කර ගැනීමට සමත් වී ඇත.

### 4.4.3. පොලී අනුපාත අවදානම

නැවත පොලී නියම කිරීමේ සාමාන්‍ය කාලය කෙටි වීම සහ වසරක් ඇතුළත නැවත පොලී නියම කළ යුතු ණය කොටසෙහි විශාලත්වය වැඩිවීම හේතුවෙන් දේශීය ණය කළඹ, විදේශ ණය කළඹට වඩා ඉහළ පොලී අනුපාත අවදානමක් දරයි. මෙම අවදානමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ, වසරක් ඇතුළත කල් පිරෙන ඉහළ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය යි. 2025 අවසානය වන විට පුරෝකථනය කර ඇති පරිදි, භාණ්ඩාගාර බිල්පත් මුළු ණය කළඹෙන් සියයට 10.7 ක් වන අතර, එය ප්‍රතිමූල්‍යකරණ අවදානමට මෙන්ම පොලී අනුපාත අවදානමට ද දායක වේ. කෙසේ වෙතත්, කෙටි කාලීන කල්පිරීමේ ව්‍යුහයක් පැවතියද, ණය උපකරණවල සැලකිය යුතු කොටසක් ස්ථාවර පොලී අනුපාතයන්ගෙන් සමන්විත වීම හේතුවෙන් පොලී පිරිවැය ස්ථායීතාවයට සහාය වන පරිදි මෙම අවදානමට නිරාවරණය වීම අර්ධ වශයෙන් සමනය කරයි.

ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, විදේශ ණය පැතිකඩ තුළ විචල්‍ය පොලී අනුපාත සහිත ණය උපකරණවල ප්‍රමාණය තරමක් ඉහළ අගයක් (විදේශ ණය කළඹෙන් සියයට 21.3) ගත්තද, එය සැලකිය යුතු තරම් දිගු නැවත පොලී නියම කිරීමේ සාමාන්‍ය කාලයකින් ප්‍රයෝජන ලබයි. මෙය, ප්‍රතිමූල්‍යකරණය හෝ පොලී නැවත නියම කිරීමේ අවශ්‍යතාවයේ වාරගණන අඩු කරයි. ඉදිරියේදී ඇතිවිය හැකි පොලී අනුපාත කම්පනවලට එරෙහිව නම්‍යශීලීභාවය ශක්තිමත් කිරීමට නැවත පොලී නියම කිරීමේ සාමාන්‍ය කාලය දීර්ඝ කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානයක් යොමු කිරීම සහ ස්ථාවර පොලී අනුපාත නිකුත් කිරීම්වලට ප්‍රමුඛතාවය දීම අත්‍යවශ්‍ය වනු ඇත.

### 4.4.4. විදේශ විනිමය අවදානම

වගුව 02 හි දැක්වෙන පරිදි, විදේශ ව්‍යවහාර මුදල් වලින් ලබාගෙන ඇති ණය (මුළු ණය ප්‍රමාණයෙන් සියයට 37.8) සැලකිය යුතු ප්‍රමාණයක් පැවතීම හේතුවෙන්, ව්‍යුහාත්මක විදේශ විනිමය අවදානම මධ්‍යස්ථ මට්ටමක පවතී. විදේශ ණය කළඹෙහි සැලකිය යුතු කොටසක් එක්සත් ජනපද ඩොලර්වලින් ද අඩු ප්‍රමාණයක් ජපන් යෙන්, චීන යුවාන් සහ විශේෂ ගැනුම් හිමිකමෙන් ද සමන්විත වේ. මෙම අවදානම පාලනය කිරීම සඳහා, විචක්ෂණශීලී විනිමය අනුපාතික කළමනාකරණයත් හැකි අවස්ථාවන් වලදී හෙජින් උපාය මාර්ග යොදා ගැනීමත් වැදගත් වේ. ණයවල මුදල් සංයුතිය කළමනාකරණය කිරීම, සංචිත ගොඩනැගීම සහ දේශීය ණය වෙළඳපොළ වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩව දරනු ලබන උත්සාහයන් විදේශ විනිමය ආශ්‍රිත අවදානම් තවදුරටත් අඩු කරනු ඇත.

රූප සටහන 05: මුදල් ඒකක අනුව විදේශ ණය සංයුතිය ප්‍රතිශතයක් ලෙස



# 5. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සහ රජයේ ණය තිරසරභාවය කෙරෙහි එහි බලපෑම

2022 වසරේ වූ අර්බුදයෙන් පසු සිය ආර්ථිකය ස්ථාවර කර ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයේදී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. ප්‍රතිව්‍යුහගත කිරීම ක්ෂණික මූල්‍ය සහනයක් මෙන්ම දිගුකාලීන ප්‍රතිලාභ ද ලබා දුන් අතර, රටෙහි රාජ්‍ය ණය වල ගමන් මග සැලකිය යුතු ලෙස වෙනස් කළ අතර රාජ්‍ය මූල්‍ය හා ආර්ථික ස්ථාවරත්වය කරා යන මාවත විවර කළේය.

## 5.1 ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ජයග්‍රහණ

### *1. ක්ෂණික මූල්‍ය සහනය සහ ණය අඩු කිරීම*

ප්‍රතිව්‍යුහගත කිරීම මගින් රටේ ප්‍රතිව්‍යුහගත කරන ලද ණයවල ශුද්ධ වර්තමාන වටිනාකම සියයට 41 කින් අඩු කිරීමෙන් ණය බර සැලකිය යුතු ලෙස ලිහිල් විය. මෙම අඩුකිරීම මගින් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය කරන ලද අතර, එමගින් තීරණාත්මක සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන් සඳහා අරමුදල් වෙන් කිරීමට රජයට හැකි විය.

ප්‍රතිව්‍යුහගත කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය 2027 සිට 2032 කාලය තුළ දී වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක උපරිමයකට සීමා කර සැලකිය යුතු සහනයක් ලබා දීමත් රජයට සිය රාජ්‍ය මූල්‍ය බැඳීම් වඩා හොඳින් කළමනාකරණය කිරීමට ඉඩසැලසීමත් සිදුවුණි. ණය ගෙවීම පැහැර හැරීම වැළැක්වීමටත්, සමාජ සේවා හා යටිතල පහසුකම් වැනි අත්‍යවශ්‍ය අංශවල ආයෝජන සක්‍රිය කිරීමටත් මෙම අඩු කිරීම ඉතා වැදගත් වේ.

### *2. ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය මූල්‍ය විනය*

ණය ප්‍රතිව්‍යුහගත කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකමට අනුකූල වූ අතර, එය රාජ්‍ය මූල්‍ය විනය සඳහා පැහැදිලි ඉලක්ක ලබා දීමට උපකාරී විය. ප්‍රධාන අරමුණු අතර 2032 වසර වන විට රාජ්‍ය ණය කළඹ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 දක්වා අඩු කිරීම සහ 2027 සිට 2032 කාලය තුළ වාර්ෂිකව දළ මූල්‍ය අවශ්‍යතා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීමත් ඇතුළත් වේ.

සාර්ව සම්බන්ධිත බැඳුම්කර සහ පාලන සම්බන්ධිත බැඳුම්කර හඳුන්වා දීම ණය සේවාකරණයේ නම්‍යශීලී බව තවදුරටත් තහවුරු කළ අතර රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සඳහා පෙළඹවීමක් ද ඇති කළේය. සාර්ව සම්බන්ධිත බැඳුම්කර ණය ගෙවීම්, ආර්ථික කාර්ය සාධනයට සම්බන්ධ වන අතර, රාජ්‍ය මූල්‍ය සහ පාලන ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගන්නේ නම් පාලන සම්බන්ධිත බැඳුම්කර හරහා අතිරේක සහනයක් ලබා දෙනු ඇත.

### *3. දේශීය ණය සහනය සහ මූල්‍ය පද්ධති ස්ථාවරත්වය*

2023 වසරේ දී සිදු කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimization - DDO) මගින් මූල්‍ය පද්ධතිය අස්ථාවර නොකර දේශීය මූල්‍යකරණය මත ඇති වන පීඩනය සමනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. එහිදී පහත ප්‍රධාන ක්‍රියාමාර්ග ඇතුළත් විය;

- ද්‍රවශීලතා සහනයක් ලබා දෙමින් විදේශ මුදල් වලින් නාමනය කරන ලද බැඳුම්කර නැවත විචල්‍ය කූපන් සහිත දේශීය මුදල් බැඳුම්කර බවට පරිවර්තනය කිරීම
- පොලී ගෙවීම් අඩු කරමින් සහ දේශීය මූල්‍ය ආයතන මත ඇති පීඩනය ලිහිල් කරමින් අර්ථ සාධක අරමුදල් සතු වූ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම

- රාජ්‍ය මූල්‍ය නම්‍යශීලී බවක් සපයමින් කෙටිකාලීන භාණ්ඩාගාර බිලපත් දිගුකාලීන මූල්‍ය උපකරණ බවට ප්‍රතිව්‍යුහගත කිරීම

මෙම පියවර මගින් දේශීය මූල්‍ය අර්බුදයක් ඇති වීම වළක්වාලමින් 2023-2027 අතර වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් දේශීය ණය සේවාකරණය ප්‍රතිශතාත්මකව සියයට 1.2කින් අඩු කර ඇත.

### 4. වැඩි දියුණු කළ විදේශ ණය තිරසරභාවය සහ සංචිත තත්ත්වය

ප්‍රතිව්‍යුහගත කිරීම මගින් 2023-2027 දක්වා ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය ඇමරිකානු ඩොලර් බිලියන 17 කින් අඩු කරන ලද අතර, එය ගෙවුම් ශේෂ පීඩනය ලිහිල් කිරීමට සහ විදේශ විනිමය සංචිත වැඩි දියුණු කිරීමට ඉතා වැදගත් විය. 2027-2032 දක්වා වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක උපරිමයකට විදේශ විනිමය ණය සේවාකරණය පවත්වා ගැනීම පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසර ඉලක්කය රටේ විදේශ ණය සේවා සහ සංචිත තත්ත්වය තිරසර ලෙස පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

### 5. ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ සාර්ථක ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම අනුමත කිරීමෙන් පසුව 2024 වසරේ අගභාගයේදී සහ 2025 වසරේ දී රටේ ණය ශ්‍රේණිගත කිරීම් සැලකිය යුතු ලෙස ඉහළ නැංවිණි. 2022 වසරේ දී විදේශීය ණය ගෙවීම් නවතා දැමීමෙන් පසු ෆිච් ශ්‍රේණිගත කිරීම (Fitch Ratings), මූඩීස් ආයෝජන සේවා (Moody's Investors Service), සහ එස් ඇන්ඩ් පී ගෝලීය ශ්‍රේණිගත කිරීම (S&P Global Ratings) වෙතින් ලැබුණු මෙම ශ්‍රේණිගත කිරීම් ඉහළ දැමීම මගින් සිය ආර්ථිකය ස්ථාවර කිරීමටත්, ණය පැහැර හැරීමේ අවදානම අඩු කිරීමටත් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමටත් රට දරන ප්‍රයත්නයන් පිළිබිඹු කරනු ලබයි.

#### ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට බලපෑ සාධක:

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය:** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.9 ක ණය අනුමත කිරීම, රටෙහි සාර්ව ආර්ථික තත්වය ස්ථාවර කිරීම සඳහා දායක විය. ණය තිරසරභාවය යථා තත්වයට පත් කිරීම් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහනට තීරණාත්මක මෙන්ම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හා මූල්‍ය ඉලක්ක ඇතුළත් කර ඇත.

**ආර්ථික ස්ථාවරත්වය:** ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව ශ්‍රී ලංකාව සිය මුදල් ඒකකය ස්ථාවර කිරීමට සහ උද්ධමනය අඩු කිරීමට සමත් විය. ඉහළ නංවන ලද විදේශ විනිමය සංචිත සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වී ඇත.

**ප්‍රධාන ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම්:**

- ෆිච් ශ්‍රේණිගත කිරීම් 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ ණය ගෙවීම පැහැර හැරීම ශ්‍රේණිගත කිරීම "සීමිත පැහැර හැරීම (Restricted Default - RD)" සිට "CCC+" දක්වා ඉහළ නැංවීය.
- මූඩීස් ආයෝජන සේවාව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම "Ca" සිට "Caa1" දක්වා ස්ථාවර දැක්මක් සහිතව ඉහළ නැංවීය.
- එස් ඇන්ඩ් පී ගෝලීය ශ්‍රේණිගත කිරීමේ ආයතනය 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් ශ්‍රේණිගත කිරීම "වරණීය පැහැර හැරීම (Selective Default - SD)" සිට "CCC+" දක්වා ඉහළ නැංවීය.

**ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමේ බලපෑම:**

මෙම ණය ශ්‍රේණිගත කිරීම් ඉහල නැංවීම අනාගත ණය නොපියවීමේ අවදානම අඩු කරන අතර ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ධනාත්මක ප්‍රවේශයක් ඇති කරයි. මෙම ඉහළ නැංවීම් මගින් වැඩිදියුණු කරන ලද ණය කළමනාකරණයේ දැක්මක් පිළිබිඹු වන අතර, ඉදිරි දශකය තුළ දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය ආයෝජකයන්ගේ මතය කෙරෙහි ධනාත්මකව බලපාමින්, සිය ණය කළමනාකරණය කිරීමට සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ ඇති හැකියාව පිළිබඳ විශ්වාසය වැඩි කර ඇත.

# 6. පාදක සාර්ව ආර්ථික උපකල්පන

වර්ධනය, උද්ධමනය, පොලී අනුපාත, රාජ්‍ය මූල්‍ය තුලන හා විනිමය අනුපාතිකය පුරෝකථනය කරනු ලබන, රටෙහි ශක්තිමත් සාර්ව ආර්ථික රාමුවක් මත ණය කළමනාකරණ උපායමාර්ගයේ ශක්‍යතාවය බෙහෙවින් රඳා පවතී. ණය කළමනාකරණ උපායමාර්ගය සහ සාර්ව ආර්ථික රාමුව අතර පවතින අන්‍යෝන්‍ය රැඳියාව සැලකිල්ලට ගත් විට, උපායමාර්ග දෙක අතර ස්ථාවර බවක් පවත්වා ගැනීම ඉතා තීරණාත්මක වේ.

එබැවින් මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව 2026-2030 යටතේ අර්ථ දක්වා ඇති සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව සහ 2026 වසර සඳහා වාර්ෂික අයවැය පුරෝකථන සමඟ අනුකූලවන ලෙස සංවර්ධනය කර ඇත. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සකස් කිරීම සඳහා, මූලික සාර්ව ආර්ථික දැක්මෙහි අවදානම සහ ණය කළමනාකරණ උපායමාර්ගය මත එහි විය හැකි බලපෑම, උපායමාර්ගික කාලය පුරා නියතව පවතින බව උපකල්පනය කර ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ උද්ධමන පුරෝකථනය සැලකිල්ලට ගනිමින් ක්‍රය ශක්ති සමානාත්මතා ආකෘතිය භාවිතා කරමින් මධ්‍ය කාලීන විනිමය අනුපාතය පුරෝකථනය කරන ලදී. සෝෆා අනුපාතය එක්සත් ජනපද භාණ්ඩාගාර පුරෝකථනය භාවිතා කරමින් පුරෝකථනය කරන ලද අතර දේශීය භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොලී අනුපාත සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතය (AWPR) මත පදනම්ව පුරෝකථනය කරන ලදී.

සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව 2026-2030 සංවර්ධනය කර ඇත්තේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අර්ථ දක්වා ඇති ණය අඩු කිරීමේ සහ ණය තිරසාරත්වයේ අරමුණු සමඟ සමපාතවන පරිදියි. මෙම ඉලක්ක, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් ගිවිසුම යටතේ ලබා දී ඇති ණය තිරසරත්වයේ ඉලක්ක සමඟ අනුකූල වේ.

1. 2032 වන විට දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ණය අනුපාතය සියයට 95 ට වඩා අඩු මට්ටමකට අඩු කිරීම,
2. 2027-2032 කාලය තුළ, රජයේ වාර්ෂික දළ මූල්‍යයන අවශ්‍යතා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩු සාමාන්‍ය මට්ටමක පවත්වා ගැනීම,
3. රජයේ විදේශ මුදලින් වන වාර්ෂික ණය සේවාකරණය, 2027-2032 කාලය තුළ සෑම වසරකම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.

සාර්ව ආර්ථික සන්දර්භය තුළ, දළ දේශීය නිෂ්පාදිතෙයෙන් රාජ්‍ය ණය අනුපාතයේ අඩු වීමේ ප්‍රවණතාවය, මූල්‍යන පිරිවැය අඩු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීමට රජයට ඉඩ සලසනු ඇත. පවතින රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ ණය කළමනාකරණ උපායමාර්ගයේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, අවදානම් පිළිබඳ විචක්ෂණශීලී මට්ටමක් පවත්වා ගනිමින් පිරිවැය-කාර්යක්ෂම මූලාශ්‍ර වලින් අරමුදල් සුරක්ෂිත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, ණය තිරසරත්ව ඉලක්ක සපුරා ගැනීමට රජය අපේක්ෂා කරයි.

## 7. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව සකස් කර ඇත්තේ ණය කළඹේ අවදානම් දරාගැනීම සහ පිරිවැය අරමුණු මත පදනම්වය. මෙමගින්, දේශීය ණය වෙළඳපොළ පුළුල් කිරීම සහ විදේශ මූල්‍ය වෙළඳපොළට නැවත පිවිසීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ඇතුළත් වන අතර, එය රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති අරමුණු සමඟ සංගතතාව සහතික කරමින් එය මධ්‍යකාලීන සාර්ව ආර්ථික පුරෝකථන සමග ගලපා ඇත.

### 7.1 2030 වසර අවසානයේ ණය කළමනාකරණ ඉලක්ක

වගුව 3: 2030 වසර අවසාන වන විට ණය කළමනාකරණ ඉලක්ක

| **පිරිවැය සහ අවදානම් දර්ශක** | **පවතින මට්ටම (2025 අවසානය)** | **ඉලක්කගත මට්ටම (2030 අවසානය)** | **සහන සීමාව** |
|---|---|---|---|
| සාමාන්‍ය කල්පිරීමේ කාලය<br>• දේශීය ණය කළඹ<br>• මුළු ණය කළඹ | <br>වර්ෂ 4.6<br>වර්ෂ 6.8 | <br>වර්ෂ 6<br>වර්ෂ 8 | <br>1+/- |
| මුළු ණයට සාපේක්ෂව භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිශතය | 10.7% | 5% | 1+/- |
| වසරක් තුළ ප්‍රතිස්ථාපනය වන මුළු ණය ප්‍රමාණය (මුළු ණයට ප්‍රතිශතයක් ලෙස) | 26.8% | 22% | 1+/- |
| වසරක් තුළ කල් පිරෙන ණය (දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස) | 17.0% | 10% | 2+/- |
| ආදායමට සාපේක්ෂව පොලී ගෙවීම් ( ප්‍රතිශතයක් ලෙස) | 52.2% | 35% | 5+- |

*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

ඒ අනුව, පිරිවැය සහ අවදානම අතර ප්‍රශස්ත හුවමාරුවක් (optimal trade-off) සහතික කිරීම පිණිස, විවිධ ණය ගැනීමේ සංයුති සහිත විකල්ප මූල්‍යකරණ උපාය මාර්ග හතරක් පරීක්ෂා කරන ලදී. මෙම උපාය මාර්ග සලකා බැලීමේදී, එක් එක් භව්‍ය මූල්‍යණ මූලාශ්‍රයන්, ලබාගැනීමට ඇති හැකියාව, එම මූලාශ්‍රයන්ගේ පිරිවැය සහ අවදානම පිළිබඳව අවධානය යොමු කෙරිණි.දේශීය ණය කළඹ රජයේ භාණ්ඩාගාර බිල්පත් මත ඇති ඉහළ යැපීම, දේශීය ණයවල පටු පරිණත වීමේ පරාසය (narrow maturity profile), සහනදායී විදේශ මූල්‍යයන පහසුකම් ලබාගැනීමට ඇති හැකියාව, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළට නැවත ඇතුළු වීමේ හැකියාව සහ විදේශ විනිමයවලින් නම් කරන ලද දේශීය ණය සුරැකුම්පත් (FX-denominated domestic debt securities) නිකුත් කිරීමට ඇති අභිරුචිය යන සාධක මෙහිදී සලකා බලන ලදී. මෙම කරුණු 2026–2030 කාලසීමාව සඳහා ප්‍රශස්ත මූල්‍යයන උපාය මාර්ගය තෝරා ගැනීමට මඟ පෙන්වන ලදී.

## 7.2 මූල්‍යකරණ උපායමාර්ගය 2026 – 2030

2026 – 2030 සඳහා වන මූල්‍යකරණ උපායමාර්ගය, වගු අංක 2 හි දක්වා ඇති ණය කළමනාකරණ ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම අරමුණු කරගනිමින් මධ්‍ය කාලීනව ණය ගැනීම් සඳහා සපයනු ලබන උපායමාර්ගික මාර්ගෝපදේශයක් ලබා දේ. එහි ප්‍රධාන උපායමාර්ගික දිශානතීන් පහත පරිදි වේ:

**අ. ණයගැනීමේ සංයුතිය:** 2026 වසර සඳහා දේශීය මූලාශ්‍ර මගින් සියයට 90 ක ණය ගැනීමේ සංයුතියක් පවත්වා ගැනීම. ඉන්පසුව 2028 න් පසු විදේශීය ණය සේවාකරණ වගකීම් සඳහා උපායමාර්ගිකව සූදානම්වීමට, දේශීය හා විදේශීය ණයලබාගැනීමේ සංයුතිය විචක්ෂණශීලීව සමතුලිත කිරීමේ අරමුණින්, දේශීය ණයගැනීම් සියයට 5 කින් අඩුකිරීම.

**ආ. විදේශීය මූල්‍යකරණ උපායමාර්ගය:** ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික මූලාශ්‍රයන්ගෙන් ලබාගන්නා අඩු පිරිවැය සහනදායී මූල්‍යකරණයන් උපරිම කර ගැනීම. ඒ සමඟම, නිල ණය දෙන්නන්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙළඳපොලේ ඇති අඩු වියදම් මූල්‍යකරණ විකල්ප අවස්ථාවන් ගවේෂණය කිරීම.

**ඇ. දේශීය වෙළෙඳපොළ උපායමාර්ගය:** දේශීය වශයෙන්, භාණ්ඩාගාර බිල්පත් මත යැපීම ක්‍රමයෙන් අඩු කිරීමෙන් ප්‍රතිමූල්‍යකරණ අවදානම කළමනාකරණය කිරීම අරමුණු කර ගැනීම. මේ සඳහා සාමාන්‍ය කල්පිරීමේ කාලය දීර්ඝ කරගැනීම සහ ණය ගෙවීමේ පැතිකඩ සුමට කරගැනීම සඳහා සැලසුම්ගතව ස්ථාවර අනුපාතික සහිත වර්ෂ 3, 5, 8, 10, 12 සහ 15 යන කල්පිරීමේ කාලයන්ගෙන් යුතු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත්කිරීම මගින් සහය වනු ඇත. ඊට අමතරව, රජයේ සුරැකුම්පත් වෙළඳපොළට විදේශ විනිමය ද්‍රවශීලතාවය සහිත දේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා, දේශීය වෙළෙඳපොළ තුළ විදේශ විනිමය මගින් නාමනය කරන ලද බැඳුම්කර සීමිත වශයෙන් නිකුත් කිරීම ද සලකා බලනු ලැබේ.

මධ්‍යකාලීන ණය කළමණාකරණ උපායමාර්ගයෙහි ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා, රාජ්‍ය ණය කළමණාකරන කාර්යාලය පහත කරුණු කෙරෙහි අවධානය යොමුකරනු ලබයි.

I. **රජයේ දේශීය බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය,** ආයෝජක පදනම පුළුල් කිරීමෙන් සහ රජයේ ණය සුරැකුම්පත් සඳහා වන සිල්ලර වෙළෙඳපල සංවර්ධනය කිරීමේ හැකියාව සොයා බැලීම මගින් රජයේ දේශීය වෙළඳපොළ සංවර්ධනය කිරීම. ප්‍රාථමික අලෙවිකරු පද්ධතිය සහ දේශීය ණය වෙළඳපොළ පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කරනු ලබන අතර ඒ අනුව සුදුසු පියවර ගනු ලැබේ.

II. **ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙළඳපොළට නැවත ඇතුළුවීම සඳහා ගමන් මග සැලසුම් කිරීම.** ණය ප්‍රතිව්‍යුහගත කරණ ක්‍රියාවලිය යටතේ අලුතින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර් වලින් නාමනය කර ඇති, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල කල්පිරීමේ ව්‍යුහය අනුව, 2028 සිට සැලකිය යුතු ප්‍රමාණයක් පියවීමට නියමිතව ඇත. ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙළඳපොළට නැවත ඇතුළු වීමට පෙර සූදානම් වීමේ පියවර ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ. ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම සහ හිතකර ලෙස ණය ශ්‍රේණිගත කිරීම ප්‍රධාන පූර්ව අවශ්‍යතා ලෙස පවතින අතර, ආයෝජක සබඳතා වැඩිදියුණු කිරීම සහ ණය විනිවිදභාවය වැඩිදියුණු කිරීම ද ඒ හා සමානව තීරණාත්මක වනු ඇත. සුමට ප්‍රතිමූල්‍යකරණ ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා මෙම පෙර සූදානම් කිරීමේ ක්‍රියාමාර්ග පූර්වගාමීව ගනු ලබයි.

III. ආණ්ඩුවේ ණය කළඹෙහි වත්මන් ව්‍යුහය සහ අවදානම් පැතිකඩ පූර්වගාමීව කළමණාකරණය කිරීම සඳහා **වගකීම් කළමනාකරණ මෙහෙයුම් සිදුකිරීම**. පවත්නා ණය කළඹෙහි ප්‍රතිමූල්‍ය කරණ අවදානම කළමනාකරණය කිරීම, දේශීය ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම, ණය සේවාකරණ පිරිවැය අවම කිරීම අරමුණු කරගනිමින් වගකීම් කළමණාකරන ක්‍රියාකාරකම් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව, ණය කළඹෙහි විනිමය අවදානම අඩු කිරීමේ මූලික අරමුණ ඇතිව, විදේශ ණය කළඹ සඳහා විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු වැනි වගකීම් කළමනාකරණ මෙහෙයුම් සිදු කිරීමට කටයුතු කරනු ලබයි.

IV. **ණය කළමනාකරණයේ පාලනය සහ විනිවිදභාවය සහතික කිරීම.** රාජ්‍ය ණය ප්‍රකාශන සහ සම්බන්ධීකරණ උපාය මාර්ගය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම මගින් ණය කළමනාකරණයේ පාලනය සහ විනිවිදභාවය සහතික කිරීම. රාජ්‍ය ණය කලමණාකරණය පිළිබඳව විස්තීර්ණ අවබෝධයක් ලබාදෙනු ලබන වාර්ෂික වාර්තාව, නිකුත් කිරීම මෙයට ඇතුලත් වේ. ඊට අමතරව, පවත්නා ප්‍රකාශන වන කාර්තුමය සංඛ්‍යානමය ණය ප්‍රකාශනය සහ අර්ධ වාර්ෂික ණය දත්ත වාර්තාවෙහි, ගුණාත්මකභාවය සහ ආවරණය වැඩිදියුණු කරනු ලබන අතර අදාළ පාර්ශවකරුවන් සඳහා වඩාත් සවිස්තරාත්මක සහ කාලීන තොරතුරු ලබාදීම සහතික කරනු ලබයි.

තොරතුරු මධ්‍යගතකරණය කිරීම, පරිශීලක ප්‍රවේශය වැඩිදියුණු කිරීමට, මහජනතාව හා වෙළෙඳපොළ සහභාගීවන්නන් සමග අන්තර් ක්‍රියාකාරී සන්නිවේදන පහසුකම් සැලසීමට වෙන් වූ වෙබ් අඩවියක් ද රාජ්‍ය ණය කළමණාකරණ කාර්යාලය සඳහා පිහිටුවනු ඇත. එසේම, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම ඉදිරි වසර සඳහා රජයේ මූල්‍යායන උපායමාර්ගය ගෙනහැර දක්වනු ඇත. රජයේ ණය ගැනීමේ ප්‍රවේශය දිගුකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වන බව සහතික කරමින්, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 හි මාර්ගෝපදේශවලට අනුකූලව මෙම සැලැස්ම සකස් කරනු ලබයි. දේශීය ණය සුරැකුම්පත් වෙන්දේසි දින දර්ශනය, වාර්ෂික ණයගැනීමේ සැලැස්මට අනුකූල වන අතර කාර්තුමය වශයෙන් චක්‍රීය පදනමක් මත ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙමගින් ඕනෑම නිශ්චිත ණය නිකුත් කිරීමට පෙර මාස තුනක පූර්ව දැනුම්දීමක් සිදු කරන බැවින්, වෙළඳපොළ නිරන්තරයෙන් යාවත්කාලීන වන බව සහතික කෙරේ.

V. මූල්‍ය ස්ථාවරත්වය, අවම ණය ලබාගැනීමේ පිරිවැය, ප්‍රතිමූල්‍යකරණ හා පොලී අනුපාතික අවදානම අවම කිරීමට **මුදල් සංචිත උපායමාර්ගිකව උපයෝජනය කිරීම**. ඉහළ පොලී අනුපාතික යටතේ ණය නැවත නිකුත් කිරීමකින් තොරව, භාණ්ඩාගාර බිල්පත් හෝ කෙටි කාලීනව කල්පිරෙන බැඳුම්කර වැනි ණය උපකරණ ආපසු ගෙවීම සඳහා මුදල් සංචිත විචක්ෂණශීලීව යොදවා ගනු ඇත. ප්‍රශස්ත මුදල් සංචිතය තීරණය කිරීමේ දී, ණය සේවකරණ බැඳීම් (ද්‍රවශීලතා අවදානම), ආදායම්වල හෝ වෙළඳපොළ ප්‍රවේශයේ අස්ථාවරත්වය (කම්පන අවශෝෂණය) සහ අනපේක්ෂිත තත්ත්වයන් නිසි ලෙස සලකා බලන අතර භාවිතා නොකරන ලද අරමුදල් ප්‍රමාණය අවම කර ගනිමින් කෙටි කාලීන බැඳීම් ආවරණය කිරීමට ප්‍රමාණවත් මුදල් තබා ගැනීම අරමුණු කෙරේ. ක්‍රමානුකූල ප්‍රවේශයක් සහතික කරමින් සහ අහඹු ක්‍රියා පටිපාටි වළක්වා ගැනීමින් පොලී අනුපාත සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම් අවම කිරීම සඳහා ක්‍රමවත් ප්‍රවේශයකින් මුදල් සංචිතය භාවිත කිරීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් නියාමනය කරනු ඇත.

## 7.3. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

රාජ්‍ය මූල්‍ය සහ මුදල්, ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 ක්‍රියාත්මක කරනු ඇත. රජයේ ණය ගැනීමේ උපාය මාර්ගයේ මෙහෙයුම් රාමුව ලෙස ක්‍රියා කරන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2026 මගින් මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සවිස්තරාත්මක ව ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම දක්වා ඇත.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2026 සකස් කිරීමේදී, එය මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සමඟ ගැලපීම සහතික කිරීම සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් සහ මුදල් කළමනාකරුවන් සමඟ සමීපව කටයුතු කරනු ඇත. මෙම සහයෝගී ප්‍රවේශය සමස්ත රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්තිය සමඟ ණය කළමනාකරණ මෙහෙයුම්වල සහජීවනය වැඩි දියුණු කරන අතර, හොඳින් ඒකාබද්ධ වූ ප්‍රවේශයක් ඇති කරනු ලබයි.

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයහි ප්‍රගතිය සහ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නිති කාලීන සමාලෝචන පවත්වනු ඇත. මෙම සමාලෝචන රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන අතර එමගින් විනිවිදභාවයෙන් යුතු අධීක්ෂණය සහ ජාතික ණය කළමනාකරණ අරමුණු සමඟ අඛණ්ඩ පෙළගැස්ම සහතික කෙරේ. සැලසුම් කළ උපාය මාර්ගයෙන් බැහැරවීම් හඳුනාගත හොත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් එම අභියෝගවලට පිළියම් යෙදීමටත්, මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙහි ඉලක්ක කාලෝචිත හා කාර්යක්ෂම ආකාරයකින් සපුරා ඇති බව සහතික කිරීමටත් පූර්ව ක්‍රියාකාරී නිවැරදි කිරීමේ පියවර ගනු ඇත.

## 7.4. සීමාවන් සහ අභියෝග

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සකස් කිරීම මගින් මධ්‍යකාලීනව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා මග පෙන්වන ශක්තිමත් රාමුවක් ලබා දෙනු ලැබුවද, එමගින් නියම කරනු ලබන ඉලක්ක සපුරා ගැනීමේදී මෙන්ම උපාය මාර්ගය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේදී විවිධ වූ සීමා සහ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026 -2030 හි ප්‍රධාන සීමා සහ අභියෝග වන්නේ;

I. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සකස් කිරීමේදී භාවිතා කරනු ලබන ණය දත්ත සපයාගැනීමේ ඇති හැකියාව, ආවරණය සහ විශ්වාසනීයත්වය. 2026-2030 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කිරීමේදී, ආණ්ඩුවේ ණය දත්ත පමණක් යොදා ගෙන ඇත. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය මෙරිඩියන් (Meridian ) ණය

කළමනාකරණ පද්ධතිය ලබා ගැනීමට කටයුතු කිරීම හරහා දැනට පවතින තනි ණය දත්ත පද්ධතියක් නොමැතිවීමේ සීමාව සඳහා විසඳුමක් වනු ඇති අතර එය සියළුම දේශීය හා විදේශීය ණය දත්ත සඳහා තනි ණය දත්ත පද්ධතියක් සපයනු ඇත.

II. විනිමය අනුපාතික අස්ථාවරත්වය සහ පොලී අනුපාතික උච්චාවචනයන්, විදේශ ණය කළඹ සඳහා අමතර අවදානමක් එක් කරන අතර, ඒවා සීමා කිරීමට හෝ පුරෝකථනය කිරීමට අපහසු විය හැකිය.

III. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සකස් කිරීමේදී භාවිතා කර ඇති මූලික සාර්ව ආර්ථික පුරෝකතන සහ උපකල්පන කාලයත් සමඟ වෙනස් විය හැකිය. ආර්ථික වර්ධනය, උද්ධමනය, රාජ්‍ය මූල්‍ය හිඟයන්, පොලී අනුපාතික සහ විනිමය අනුපාතික පිළිබඳ අවිනිශ්චිතතා සැබෑ ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑ හැකිය.

IV. දේශීය වෙළඳපොළ ප්‍රශස්ත මට්ටමට සංවර්ධනය වී නොමැති බැවින් සීමිත ආයෝජක විවිධාංගීකරණය සහ කෙටි කල්පිරීම් සහිතව, දේශීය වෙළඳපොළ සංවර්ධන නොවූ මට්ටමක පැවතීමෙන් , ණය ඵලදා වක්‍රය දීර්ඝ කිරීමට හෝ කල්පිරෙන ණය අඩු පිරිවැයක් සහිතව ප්‍රතිමූල්‍යකරණය කිරීමට රජයට ඇති හැකියාව සීමා කරයි. ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන් සහ සහනදායී සම්පත් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, විදේශීය මූල්‍යකරණ විකල්ප කෙරෙහි බලපාන අතර එමඟින් ණය ගැනීමේ තේරීම්වල නම්‍යශීලීභාවය සීමා කරනු ඇත.

V. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකා මහ බැංකුව සහ රේඛීය අමාත්‍යාංශ වැනි ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණ දුර්වලතා, ණය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති අතර නොගැලපීම් ඇති කළ හැකිය.

# 8. නිගමනය

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ණය කළමනාකරණය සඳහා පුළුල් හා ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් 2026–2030 මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් නියෝජනය කරයි. ප්‍රතිමූල්‍යකරණය සහ පොලී අනුපාතික නිරාවරණය වැනි අවදානම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, ණය ගැනීමේ පිරිවැය අඩු කරන අතරම දිගුකාලීන ණය තිරසාරභාවය ළඟා කර ගැනීම උපාය මාර්ගයේ අරමුණයි. කාලයත් සමඟ බාහිර ණය ගැනීම් මත යැපීම අඩු කිරීමත් සමඟ කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් සැලසුම් සහගතව අඩුකිරීම ඇතුළු දේශීය වෙළඳපොළ නැඹුරු මූල්‍යකරණය කෙරෙහි අඛණ්ඩව අවධාරණය කිරීම උපාය මාර්ගයේ ප්‍රධාන අංගයකි.

කෙටි කාලීන ණය අඩු කිරීම, ණය කල් පිරීම් කාලය දීර්ඝ කිරීම සහ පොලී ගෙවීමේ සහ ආදායම් අතර අනුපාතය අඩු කිරීම මගින් ණය තිරසරභාවය වැඩි දියුණු කිරීමට මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් අපේක්ෂා කරයි. එමඟින් රාජ්‍ය මූල්‍ය නම්‍යශීලීභාවය වැඩි දියුණු වන අතර ණය සේවාකරණයේ බර අඩු වේ.

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් දේශීය ආයෝජක පදනම පුළුල් කිරීම, ණය විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ ණය කළමනාකරණයේ පාලනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මෙම උත්සාහයන් ආයෝජක විශ්වාසය ශක්තිමත් කරනු ඇති අතර වඩාත් ස්ථාවර සහ තිරසර ණය කළමනාකරණ පරිසරයකට සහාය වනු ඇත.

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා ශක්තිමත් රාමුවක් සපයන අතර, දේශීය හා ගෝලීය ආර්ථික අභියෝග හමුවේ මූල්‍ය ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වේ. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ ණය තිරසරභාවය සහතික කරමින්, රජයේ ණය කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇත.

**PDMO**

Public Debt Management Office|Sri Lanka

# වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම

## තනි අවුරුදු මූලායකරණ උපාය මාර්ගය

## 2026

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

© 2026 රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

ලේකම් කාර්යාලය (3 වන මහල)
කොළඹ 00100
ශ්‍රී ලංකාව
info@pdmo.gov.lk

ABP

26

# වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම

## අන්තර්ගතය


1. හැඳින්වීම
2. ණය ගැනීමේ අවශ්‍යතාව
3. ණය ගැනීමේ සංයුතිය
4. ණය ගැනීමේ මිශ්‍රණය
5. අධීක්ෂණය සහ වාර්තාකරණය
6. **නිගමනය**


**වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම සඳහා වන නෛතික අවශ්‍යතාව**

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම (ABP) සකස් කිරීම සඳහා වන නෛතික පදනම 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති අතර වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සමඟ අනුකූල වන පරිදි සකස් කළ යුතු බවට නියම කර ඇත. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් සෑම මුදල් වර්ෂයක් සඳහාම වාර්ෂික ණය ගැනීමේ සැලැස්මක් එම වර්ෂය සඳහා වන විසර්ජන පනතට අනුකූලව ශ්‍රී ලංකා රජයේ සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස සකස් කළ යුතුව ඇත. තවද, රාජ්‍ය ණය කළමනාකරණ පනත මඟින්, එම ණය ගැනීමේ සැලැස්ම අර්ධ වාර්ෂිකව සමාලෝචනය කළ යුතු බවට ද නියම කර ඇත.

## 1.හැඳින්වීම

මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ඉදිරි වසර සඳහා වන පැහැදිලි හා ක්‍රියාවට නැංවිය හැකි සැලැස්මක් වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම හරහා සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවකි. එම වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම අදාළ මූල්‍ය වර්ෂය සඳහා රජයේ දළ මූල්‍ය අවශ්‍යතාය සපුරාලීම සඳහා නිර්මාණය කරන ලද තනි අවුරුදු මූල්‍යකරණ උපායමාර්ගයක් ලෙස කටයුතු කරයි.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම, ණය කළමනාකරුවකුගේ ප්‍රාථමික අරමුණ වන ණය සේවාකරණ බැඳියාවන් ඇතුළු රජයේ මූල්‍යකරණ අවශ්‍යතා විචක්ෂණශීලී අවදානම් මට්ටමකින් යුක්තව කාලෝචිතව හා අවම පිරිවැයක් සහිතව සපුරාලීම සහතික කිරීම සඳහා උපයෝගී වේ. ආදායම්, වියදම් සහ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ පුරෝකථන සැලකිල්ලට ගනිමින්, ඉදිරි වසර සඳහා වන දළ මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා වන මූල්‍යකරණ උපායමාර්ගය වාර්ෂික ණය ගැනීමේ සැලැස්මෙන් විදහා දක්වයි. මේ අනුව, මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයට අදාලව පළමු වසර ක්‍රියාත්මක කිරීමට නියමිත සැලැස්ම වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මගින් නිරූපණය කෙරේ.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම රජයේ ණය ගැනීමේ රාමුවේ මූලිකාංගයක් වේ. එමගින් අදාළ මූල්‍ය වර්ෂය සඳහා රජයේ දේශීය සහ විදේශීය ණය ගැනීම් පාලනය කරන අරමුණු, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ පෙන්නුම් කරයි.

2026 වසර සඳහා වන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මගින්, ණය ගැනීමේ පිරිවැය අවම කර ගනිමින් සහ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කර ගනිමින්, මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරමින්, රජයේ ණය ගැනීමේ උපායමාර්ගය සහ යෝජිත ණය ගැනීමේ සංයුතිය දක්වයි. 2026 වසර සඳහා වන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 සමඟ සම්පූර්ණයෙන්ම අනුකූල වේ.

භාවිතා කිරීමට නියමිත ණය උපකරණ, ණය ගැනීමේ මූලාශ්‍ර සහ ණය ගැනීමේ මෙහෙයුම්වලට අදාල වන කාල වකවානු ඇතුළත් කරමින් රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුකූලව, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම-2026 හි සවිස්තරාත්මක අනුවාදයක් 2026 මූල්‍ය වසර ආරම්භ වීමට පෙර ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## 2. ණය ගැනීමේ අවශ්‍යතාවය

වගුව 01- දළ මූල්‍ය අවශ්‍යතා - 2026

| | 2026 ඇස්තමේන්තුව රු. බිලියන | |
|---|---|---|
| **ප්‍රාථමික වියදම්** | | **4,485** |
| පුනරාවර්තන වියදම් | 3,105 | |
| ප්‍රාග්ධන වියදම් | 1,380 | |
| **ආණ්ඩුවේ ණය සේවාකරණය** | | **4,495** |
| පොලී ගෙවීම් | 2,617 | |
| ණය ආපසු ගෙවීම්* | 1,878 | |
| **අත්තිකාරම ගිණුම සඳහා ප්‍රතිපාදන** | | **10** |
| **සමස්ත වියදම** | | **8,990** |
| **සමස්ත ආදායම** | | **5,355** |
| **රජයේ සුරැකුම්පත් සඳහා පොත් සහ මුහුණත් අගයන් සඳහා ගැලපීම** | | **105** |
| **දළ මූල්‍ය අවශ්‍යතාවය**** | | **3,740** |
| දේශීය මූල්‍යනය | 3,040 | |
| විදේශීය මූල්‍යනය | 700 | |
| විසර්ජන පනත් කෙටුම්පත් අනුව දළ ණය ගැනීමේ සීමාව | | **3,740** |

වගුව 01 ට අනුව, 2026 වසර සඳහා රජයේ සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාව, එම වසර තුළ කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා වන රුපියල් බිලියන 3,600 හැර , රුපියල් බිලියන 3,740 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. රජය විසින් මෙම කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත්වලින් රුපියල් බිලියන 500 ක් මුදල් සංචිත භාවිත කරමින් පියවීමට සැලසුම් කර ඇති අතර, ඒ අනුව වෙළෙඳපොළ හරහා නැවත මූල්‍යකරණය කළ යුතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් බිලියන 3,100 දක්වා අඩු වේ.

ඒ අනුව,කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් නැවත මූල්‍යකරණය කිරීම ඇතුළුව සමස්ත මූල්‍යකරණ අවශ්‍යතාව 2026 වසර සඳහා රුපියල් බිලියන 6,840 ක් ලෙස පුරෝකථනය කර ඇත.

2026 වසරේ රජයේ සමස්ත ඇස්තමේන්තුගත වියදම වන රුපියල් බිලියන 8,990 ක්, බදු සහ බදු නොවන ආදායම්, ප්‍රදාන සහ ණය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. ආදායම් සහ ප්‍රදාන රුපියල් බිලියන 5,355 ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, ඉතිරි රුපියල් බිලියන 3,740 ක හිඟයක් පවතී. මෙම හිඟය විදේශීය ණය ගැනීම් සහ දේශීය ණය ගැනීම් මඟින් පිළිවෙලින් රුපියල් බිලියන 700ක් හා රුපියල් බිලියන 3040ක් ලෙසින් මූල්‍යනය කරනු ඇත (වගුව 01).

2026 දී රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම් හරහා දේශීය ණය ගැනීම් ලෙසින් රුපියල් බිලියන 3,040ක් දේශීය වෙළෙඳපොළෙන් ලබා ගන්නා අතර දැනටමත් ගිවිසුම්ගත වී ඇති ණය සහ අළුතින් ගිවිසුම් ගතවීමට නියමිත බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය දෙන ආයතනවලින් රුපියල් බිලියන 700 ක දළ විදේශීය ණය ගැනීම් ලබාගැනීමට අපේක්ෂිතය.

*2026 වසරේ විසර්ජන පනත් කෙටුම්පතේ 2 (ආ) වගන්තියට අනුව, 2026 මූල්‍ය වර්ෂය තුළ සිදු කරනු ලබන ණය ගැනීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා කෙටි කාලීන ණය ගැනීමේ ප්‍රමාණය තීරණය කිරීමේ දී, 2026 මූල්‍ය වර්ෂය තුළ සිදුකරන ලද කෙටිකාලීන ණය ගැනීම් ප්‍රමාණය සහ 2026 මූල්‍ය වර්ෂය තුළ ගෙවීම් කරනු ලබන කෙටිකාලීන ණය ප්‍රමාණය අතර පවතින වෙනස සලකා බලනු ලබයි.

ඒ අනුව, ණය ආපසු ගෙවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් කල් පිරීම් ඇතුළත් කර නොමැත.

** 2026 වසර තුළ කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් හැර .

2026 වසර තුළ කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 3,600 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ණය ගැනීමේ සංයුතිය තීරණය කිරීමේ දී සලකා බලා ඇත.

## 3. ණය ගැනීමේ ව්‍යුහය

රූප සටහන 01 : ණය ගැනීමේ ව්‍යුහය ( මුදල් ඒකක අනුව)

විදේශ ව්‍යවහාර මුදලින් මූල්‍යකරණය රු.බිලියන 800 + ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍යකරණය රු බිලියන 6,040 = මුළු දළ මූල්‍යකරණ අවශ්‍යතාවය රු.බිලියන 6840

රූප සටහන 02 : ණය ගැනීමේ ව්‍යුහය (පදිංචිය අනුව)

විදේශීය මූල්‍යකරණය රු බිලියන 700 + දේශීය මූල්‍යකරණය රු බිලියන 6140 = මුළු දළ මූල්‍යකරණ අවශ්‍යතාවය රු.බිලියන 6840

**විදේශීය මූල්‍යකරණය**

2026 වසරේ දී රජය, විදේශීය මූලාශ්‍ර හරහා රුපියල් බිලියන 700 ක් මූල්‍යනය කිරීමට සැලසුම් කරයි. මෙයින්, ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් බිලියන 250 ක්, ලෝක බැංකුවෙන් රුපියල් බිලියන 50 ක් සහ ව්‍යාපෘති සහ වැඩසටහන් මූල්‍යකරණය සඳහා වන අනෙකුත් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ණය දෙන ආයතනවලින් රුපියල් බිලියන 190 ක් ඇතුළුව, රුපියල් බිලියන 490 ක් බාහිර බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය දෙන ආයතනවලින් ලබා ගැනීමට රජය අපේක්ෂා කරයි. අතිරේක රුපියල් බිලියන 210 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් විස්තීර්ණ අරමුදල් පහසුකමේ (EFF) 7 වැනි සහ 8 වැනි වාරික ලෙස ලබා ගැනීමට නියමිතය.

**දේශීය මූල්‍යකරණය**

2026 වසරේ දී, සමස්ත මූල්‍යකරණ අවශ්‍යතාවන්ගෙන් සියයට 90 ක් වන, රුපියල් බිලියන 6,140 ක් දේශීය වෙළෙඳපොළ හරහා රැස් කිරීමට ඇස්තමේන්තු කර ඇත. මෙම මූල්‍යකරණය පොදු වෙන්දේසි මඟින් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම හරහා සපුරා ගනු ඇත. ප්‍රාථමික වශයෙන්, භාණ්ඩාගාර බැඳුම්කර එම වර්ෂය සඳහා වන මධ්‍ය කාලීන හා දිගු කාලීන දේශීය ණය උපකරණය ලෙස කටයුතු කරනු ඇත. රජය විසින්, වසර 3 සිට අවුරුදු 15 දක්වා කල් පිරීම සහිතව දේශීය වෙළෙඳපොළ තුළ රුපියල් වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 2,940 ක් රැස් කිරීමට අපේක්ෂා කරයි. එමෙන්ම, රජය විසින් වසර තුළ අවුරුදු 3 ක් දක්වා කල් පිරීම් කාලයකින් යුක්තව විදේශ විනිමයන්ගෙන් නාමකරණය කරන ලද රුපියල් බිලියන 100 ක වටිනාකමකින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර ද දේශීය වෙළෙඳපොළට නිකුත් කිරීමට සැලසුම් කරයි.

රුපියල් බිලියන 3,100 ක වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බිල්පත් වසරක් දක්වා කල් පිරීම් කාලයක් සහිත කෙටි කාලීන ණය උපකරණ ලෙස පවතී. රජය විසින් දේශීය වෙළෙඳපොළ තුළ දින 91, දින 182, සහ දින 364 ක කල් පිරීම් සහිතව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට සැලසුම් කරයි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් 2026 වර්ෂය සඳහා වන වෙන්දේසි දින දර්ශනය කාර්තුමය පදනමින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය වක්‍රීය මාස තුනක කාලපරිච්ඡේදයක් සඳහාම යාවත්කාලීන කෙරේ. මෙම වෙන්දේසි දින දර්ශනය මඟින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දෙකම ආවරණය වේ.

2026–2030 මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයට අනුකූලව, රජය සිය දළ ණය ගැනීමේ අවශ්‍යතාවන්ගෙන් සියයට 88 ක් රුපියල් වලින් නාමනය කරන ලද දේශීය ණය උපකරණ හරහා සපුරා ගැනීමට සැලසුම් කර ඇති අතර, ඉතිරි සියයට 12 විදේශ විනිමය වලින් නාමනය කරන ලද ණය උපකරණ හරහා මූල්‍යනය කිරීමට නියමිතය.

ඒ අනුව, රූප සටහන 03 හි දැක්වෙන පරිදි රුපියල් බිලියන 800 ක් විදේශ විනිමය වලින් නාමනය කරන ලද ණය උපකරණ හරහා මූල්‍යනය කරනු ලබන අතර, මෙයින් රුපියල් බිලියන 100 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 300 ක් පමණ) විදේශ විනිමය වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ලෙස දේශීය වෙළෙඳපොළට නිකුත් කිරීම මඟින් රැස් කර ගනු ඇත.

## 05.අධීක්ෂණය සහ වාර්තාකරණය

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) විසින්, ඉලක්ක සපුරා ඇති බව සහ අවදානම් පැලපීම් සිදු කරන බව සහතික කර ගැනීම සඳහා, කාර්තුමය සමාලෝචන සමඟින් වසර පුරා 2026 වාර්ෂික ණය ගැනීමේ සැලැස්මේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කරනු ඇත.

## 4. යෝජිත ණය ගැනීමේ සංයුතිය

වගුව **02**

| මූලාශ්‍රය | වටිනාකම (ශ්‍රීලංකා රු.) | ප්‍රතිශතය |
|---|---|---|
| ද්වි පාර්ශවික | 175 | 3 |
| බහු පාර්ශවික | 525 | 8 |
| භාණ්ඩාගාර බිල්පත් | 3100 | 45 |
| ශ්‍රී ලංකා රුපියල්වලින් පවතින භාණ්ඩාගාර බැඳුම්කර | 2940 | 43 |
| විදේශ විනිමයවලින් පවතින භාණ්ඩාගාර බැඳුම්කර | 100 | 1 |
| **එකතුව** | **6840** | **100** |




| දේශීය ණය ගැනීම ශ්‍රී ලංකා රු. බිලියන 6,140 | | විදේශීය ණය ගැනීම ශ්‍රී ලංකා රු. බිලියන 700 | |
|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 50% | බහුපාර්ශවීය | 75% |
| භාණ්ඩාගාර බැඳුම්කර | 50% | ද්වි පාර්ශවීය | 25% |

## 6. නිගමනය

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම -2026 මගින් රජයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සහ ණය තිරසරභාවය සහතික කිරීම සඳහා වන උපායමාර්ගික ප්‍රවේශයක් ඉදිරිපත් කරයි. මෙම සැලැස්ම භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර හරහා දේශීය මූල්‍යකරණය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සහ සහනදායී නොවන බාහිර ණය ගැනීම් අවම කිරීමෙන්, මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2026-2030 යටතේ නියම කර ඇති පිරිවැය සහ අවදානම් ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කරයි. බාහිර අවදානම් අවම කිරීම සඳහා, බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ස්ථාවර ණය සහ ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළු මූල්‍යකරණ මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට මෙමගින් සැලසුම් කර ඇත. කාර්තුමය අධීක්ෂණය සහ විචක්ෂණශීලී අවදානම් මට්ටමක් සහිතව ණය ගැනීමේ පිරිවැය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට ඇති හැකියාව තුළින්, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2026 මගින් රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව සහ අවදානම් කළමනාකරණය සඳහා සහාය වෙමින් දිගුකාලීන ණය තිරසරභාවය සඳහා දායක වේ.